කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය - පළමු සෙමෙස්තරය 2022/2023
**SOC 4187 – ප්‍රජා සමාජ කාර්යවේදය**

**කාලය : පැ දෙකයි (02)**
**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.**

---

1 ප්‍රජා සමාජ කාර්යවේදී විෂය ක්ෂේත්‍රය තුළ 'ප්‍රජාව' යන සංකල්පය අර්ථ දැක්වීමේ ඇති සංකීර්ණතාව මිනි ප්‍රදීප් (Mini Pradeep) සහ සත්‍යමූර්තී කරිබීරන්ගේ (Sathyamurthi Karibeeran) අදහස් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

2 'බලය, වරප්‍රසාද සහ පීඩනය විවිධ සාධක සහ සන්දර්භ අනුව තීරණය වේ.' මෙම අදහස මයිකල් ස්පේන්සර්ගේ (Michael Spencer, 2008) "A Social Worker's Reflections on Power, Privilege and Oppression" යන ලිපිය ඇසුරෙන් ශ්‍රී ලාංකේය සමාජ සන්දර්භයට විශේෂ අවධානය යොමු කරමින් විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

3 පවුලෝ ෆ්රෙරේගේ (Paulo Freire, 1972) "Pedagogy of the Oppressed" නැමති ග්‍රන්ථයට අනුව සමාජය තුළ සැබෑ විප්ලවීය වෙනසක් ඇති කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපනයට සහ පීඩිතයාට විශේෂ කාර්යභාරයක් පැවරේ. මෙම අදහස නාගරික අඩු ආදායම්ලාභී ප්‍රජාවන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

4 'සමාජ පීඩනයට එරෙහිව සමූහිකව ක්‍රියා කිරීමේදී පුද්ගලයා පීඩනයට ලක්වීම වැළැක්වීම සඳහා කටයුතු කිරීම වැදගත් වේ'. මෙම ප්‍රකාශය ලීනා ඩොමිනෙලි (Lena Dominelli) සහ ජෝ කැම්ප්ලින්ගේ (Jo Campling, 2002) න්‍යායාත්මක අදහස් ඇසුරෙන් සකච්ඡා කරන්න.

5 'සමාජ කාර්යවේදියෙකු ප්‍රජා මැදිහත්වීම සඳහා පාදක කරගත යුතු එළඹුම පිළිබඳව නිශ්චිතව තීරණය කිරීම අපහසු වේ.' මෙම අදහස ඇලන් එස් යෝක්ගේ (Alan S York) අදහස් ඇසුරෙන් උදාහරණ සහිතව විභාග කරන්න.

6 'අඩු ආදායම්ලාභී ප්‍රජාවන් තුළ බලය සහ අවාසිදායක තත්ත්වයන් බහුවිධ ස්වරූපයකින් පැවතිය හැකිය.' මෙම අදහස ජිම් ලයිෆ්ගේ (Jim Life) න්‍යායාත්මක අදහස් ඇසුරෙන් උදාහරණ සහිතව විභාග කරන්න.